ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# ඉලෙක්ට්‍රොනික ගනුදෙනු (සංශෝධන)

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා විසින් 2017 අගෝස්තු මස 22 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 මැයි මස 29 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[200 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 13.00 යි. තැපැල් ගාස්තුව : රු. 15.00 යි.

2—PL 005398—510 (2017/08)

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** "අන්තර්ජාතික ගිවිසුම්වල දී ඉලෙක්ට්‍රොනික ගනුදෙනු භාවිතය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ විධිවිධාන බලාත්මක කිරීම සහ සහතික කිරීමේ සේවා සපයන්නන්ට බලපත්‍ර ලබා දීම හා බලය ලබා දීම" යන්න ඇතුළත් කිරීම සඳහා මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලැබේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ පනතට අලුත් පරමාර්ථ දෙකක් ඇතුළත් කිරීම වේ.

***4 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ නීතිය විසින් තොරතුරු මුල් ආකෘතියේම පැවතීමට හෝ රඳවා තබා ගැනීමට නියම කරන අවස්ථාවක දී පනත අදාළ කර ගැනීම සම්බන්ධ විධිවිධාන සංශෝධනය කිරීම වේ.

***5 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය වෙනුවට "ඉලෙක්ට්‍රොනික අත්සන් සඳහා නෛතික පිළිගැනීම ලබා දීම" පිළිබඳ නව වගන්තිය ප්‍රතියෝජනය කරනු ලැබේ.

***6 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ රජයේ ආයතන සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල ඉලෙක්ට්‍රොනික වාර්තා සහ ඉලෙක්ට්‍රොනික අත්සන් භාවිතය සම්බන්ධ විධිවිධාන සංශෝධනය කිරීම වේ.

***7 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය වෙනුවට "අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු යනාදිය විසින් ඕනෑම ලේඛනයක් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් භාර ගැනීම හෝ නිකුත් කිරීම" පිළිබඳ නව වගන්තිය ප්‍රතියෝජනය කරනු ලැබේ.

8 ***වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට "අර්පණය සඳහා ආරාධනා කිරීම" පිළිබඳ 11අ නව වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

***9 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඉලෙක්ට්‍රොනික වාර්තා යවනු ලැබූ වේලාව, ස්ථානය සහ ලබා ගැනීම සම්බන්ධ විධිවිධාන සංශෝධනය කිරීම වේ.

***10 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට "ඉලෙක්ට්‍රොනික සන්නිවේදනවල දෝෂ" පිළිබඳ 14අ නව වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

***11 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ "බලපත්‍රලත් හෝ බලයලත් සහතික කිරීමේ සේවා සපයන්නන්" යන්න මගින් "ප්‍රතීතනය කරන ලද සහතික කිරීමේ සේවා සපයන්නන්" යන්න ප්‍රතියෝජනය කිරීම වේ.

***12 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට "අමාත්‍යවරයා විසින් සහතික කිරීමේ අධිකාරිය කළමනාකරණය සහ පරිපාලනය කිරීම සඳහා කාර්ය සාධක බලකායන් පත් කිරීම" පිළිබඳ 18අ නව වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

***13 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ සහතික කිරීමේ අධිකාරියේ බලතලවලට සම්බන්ධ විධිවිධාන සංශෝධනය කිරීම වේ.

***14 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියයේ නීතිය බලපෑම වනුයේ සහතික කිරීමේ සේවා සපයන්නන්ට බලපත්‍ර ලබා දීම හෝ බලය දීම සම්බන්ධ විධිවිධාන සංශෝධනය කිරීම වේ.

***15 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය අදාළ කර ගැනීමේ සීමාවන් සම්බන්ධ විධිවිධාන සංශෝධනය කිරීම වේ.

***16 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ නියමයන් සෑදීම සම්බන්ධ විධිවිධාන සංශෝධනය කිරීම වේ.

***17 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ "ස්වයංක්‍රීය පණිවුඩ පද්ධතිය", "සම්මුතිය", "ඉලෙක්ට්‍රොනික ලිපිනය", "ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය", "ඉලෙක්ට්‍රොනික අත්සන", "අමාත්‍යවරයා", "මූලාරම්භක" සහ "නියම කිරීම" යන පද සඳහා නව අර්ථ නිරූපණ ඇතුළත් කිරීම වේ.

එල්. ඩී.—ඕ. 22/2016

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2017 අංක දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මේ පනතේ මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ දීර්ඝ නාමය "සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන් ප්‍රතීතනය සඳහා ද;" යන වචන වෙනුවට "සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීම සහ බලය දීම සඳහා ද; අන්තර්ජාතික ගිවිසුම් තුළ ඉලෙක්ට්‍රොනික සන්නිවේදන භාවිතය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ ප්‍රතිපාදන බලාත්මක කිරීම සඳහා ද;'' යන වචන ආදේශ කිරීමෙන් එම දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 2006 අංක 19 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නව ඡේද ආදේශ කිරීමෙන්:-

"(ඇ) යම් අධිකරණයක් වෙත යම් ඉල්ලීමක්, පෙත්සමක්, පැමිණිල්ලක්, උත්තරයක්, ලිඛිත දේශනයක් හෝ වෙනත් යම් ලේඛනයක් ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීම සඳහා පහසුකම් සැලසීම;

(ඇඇ) යම් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් අමාත්‍යාංශයක් සහ දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක් හෝ ආණ්ඩුවට අයත් හෝ ආණ්ඩුව විසින් පාලනය කරනු ලබන යම් කාර්යාලයක්, පුද්ගල මණ්ඩලයක් හෝ නියෝජිත ආයතනයක් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වෙත යම් ආකෘති පත්‍රයක්, ඉල්ලුම් පත්‍රයක් හෝ වෙනත් යම් ලේඛනයක්

ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීම සඳහා පහසුකම් සැලසීම සහ විශ්වසනීය ඉලෙක්ට්‍රොනික සන්නිවේදන මගින් කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් සැපයීම ප්‍රවර්ධනය කිරීම;";

(2) එහි (ඈ) ඡේදයේ "ප්‍රවර්ධනය කිරීම," යන වචන වෙනුවට "ප්‍රවර්ධනය කිරීම; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (ඈ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන නව ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඉ) සම්මුතිය තහවුරු කරන අවස්ථාවේ දී ප්‍රකාශයට පත් කරන ලද, මේ පනතේ 23 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති සීමාවන්ට යටත්ව සම්මුතියේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම,".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "එය ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් ලබා ගත හැකි වූ වේලාවේ සිට පැවතියේ නම්" යන වචන වෙනුවට "එය දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ සන්නිවේදනයක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් අවසන් ස්වරූපයෙන් පළමු වරට උත්පාදනය කරනු ලැබූ වේලාවේ සිට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ඉලෙක්ට්‍රොනික අත්සන් සඳහා නෛතික පිළිගැනීම.

7. යම් සන්නිවේදනයක් හෝ වෙනත් යම් ලේඛනයක් යම් තැනැත්තකු විසින් අත්සන් කළ යුතු බවට හෝ යම් සන්නිවේදනයක හෝ ලේඛනයක යම් තැනැත්තකුගේ අත්සන තිබිය යුතු බවට යම් ලිඛිත නීතියකින් විධිවිධාන සලස්වා තිබෙන අවස්ථාවක දී, එම ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වුව ද—

(අ) එම පුද්ගලයා හඳුනාගැනීමට සහ ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයේ අන්තර්ගත තොරතුරු සම්බන්ධයෙන් එම පුද්ගලයාගේ

චේතනාව දැක්වීමට ක්‍රමයක් භාවිත කරනු ලැබ ඇත්නම්; සහ

(ආ) එසේ භාවිත කරනු ලැබ ඇති ක්‍රමය—

(i) යම් අදාළ එකඟතාවයක් ද ඇතුළුව, සියලු අවස්ථානුගත කරුණු අනුව, ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය උත්පාදනය කරනු ලැබූ, යවනු ලැබූ හෝ සන්නිවේදනය කරනු ලැබූ කාර්යය සඳහා සුදුසු බවට විශ්වසනීය වන්නේ නම්; හෝ

(ii) (අ) ඡේදයේ විස්තර ලද කර්තව්‍යයන් ඉටු කර තිබෙන බවට එමගින් ම හෝ වැඩිදුර සාක්ෂි සමග ඔප්පු කරනු ලැබ ඇත්නම්,

ඉලෙක්ට්‍රොනික දත්ත පණිවුඩයකට, ඉලෙක්ට්‍රොනික ලේඛනයකට, ඉලෙක්ට්‍රොනික වාර්තාවකට හෝ සන්නිවේදනයකට අදාළව එම අවශ්‍යතාවය සපුරාලනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන උපවගන්තියේ “වෙනත් යම් නීතියක” සහ “හැකි පරිදි වූ ඉලෙක්ටොනික වාර්තා” යන වචන වෙනුවට පිළිවෙළින්, “වෙනත් යම් ලිඛිත නීතියක” සහ “හැකි පරිදි වූ ඉලෙක්ට්‍රොනික වාර්තාවක, ඉලෙක්ට්‍රොනික ලේඛනයක, දත්ත පණිවුඩයක හෝ යම් ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයක”යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ “යම් බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ අනුමතයක්” යන වචන වෙනුවට, “යම් බලපත්‍රයක්, සහතිකයක්, අවසර පත්‍රයක් හෝ වෙනත් යම් ආකාරයක අනුමතයක්” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (2) වන උපවගන්තියේ, "(1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ඉලෙක්ට්‍රොනික වාර්තා පාවිච්චි කරන ලෙස නියම කරන අදාළ බලධරයා විසින් දත්ත පණිවුඩ, ඉලෙක්ට්‍රොනික ලේඛන, ඉලෙක්ට්‍රොනික වාර්තා හෝ වෙනත් සන්නිවේදන භාවිතා කිරීමට බලය දෙන හෝ පහසුකම් සැලසීමේ කාර්යය සඳහා පහත දැක්වෙන කරුණු නිශ්චය කරන නියෝග හෝ රීති සාදනු ලැබිය හැකි ය:-" යන වචන වෙනුවට, "(1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයක් පාවිච්චි කරන ලෙස නියම කරන අදාළ බලධරයා විසින් දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් භාවිත කිරීම සඳහා බලය ලබා දීමේ හෝ පහසුකම් සැලසීමේ කාර්යය සඳහා පහත දැක්වෙන කරුණු නිශ්චය කරන රීති සාදනු ලැබීම සඳහා විෂයය භාර අමාත්‍යවරයා නිර්දේශ කරනු ලැබිය හැකි ය:—" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් යනාදිය විසින්, ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් වන යම් ලේඛනයක් භාර ගැනීම හෝ නිකුත් කිරීම.

10. සෑම අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, ආයතනයක්, රාජ්‍ය සංස්ථාවක් හෝ වෙනත් ඒ සමාන පුද්ගල මණ්ඩලයක් විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව යම් ලේඛනයක්, දත්ත පණිවුඩයක, ඉලෙක්ට්‍රොනික වාර්තාවක, ඉලෙක්ට්‍රොනික ලේඛනයක හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් වන සන්නිවේදනයක ආකාරයෙන් භාර ගැනීම හෝ නිකුත් කිරීම සිදු කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11අ වන නව වගන්තිය ඇතුළත් කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන නව වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය එම ප්‍රඥප්තියේ 11අ වන වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:—

"අර්පණ සඳහා ආරාධනය.

11අ. නිශ්චිත පාර්ශ්වයන් එකක් හෝ කිහිපයකට ආමන්ත්‍රණය කරනු නොලබන්නා වූ ඉලෙක්ට්‍රොනික සන්නිවේදන එකක් හෝ කිහිපයක් හරහා සැකසුනා වූ ද, නමුත්, යම් තොරතුරු පද්ධතියක් භාවිතා කරන පාර්ශ්වයන්ට පොදු ප්‍රවේශය ලබාගත හැකි වූ ද යම් ගිවිසුමක් තීන්දු කිරීම සඳහා වන යෝජනාවක්, එය ප්‍රතිග්‍රහණය කිරීම මගින් බැඳීමට ලක්වන බවට යෝජනාව සිදුකරන පාර්ශ්වයේ චේතනාව බවට පැහැදිලිව දක්වන්නේ නම් මිස, අර්පණය සඳහා ආරාධනා කිරීමක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන උපවගන්තියේ "මූලාරම්භකගේ පාලනයෙන් බාහිර වූ තොරතුරු පද්ධතියකට ඇතුළු වූ විට" යන වචන වෙනුවට "මූලාරම්භකගේ පාලනය යටතේ වන තොරතුරු පද්ධතියකින් බැහැර වන විට," යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන නව උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) (අ) මූලාරම්භක සහ ලිපිනය හිමිකරු අතර අන්‍යාකාරව එකඟ වී ඇත්නම් මිස, දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් ලැබුණු වේලාව පහත දැක්වෙන පරිදි නිශ්චය කළ යුතු ය. එනම් -

(i) දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් ලබාගැනීමේ කාර්යය සඳහා ලිපිනය හිමිකරු විසින් ඉලෙක්ට්‍රොනික ලිපිනයක් නම් කරනු ලැබ ඇත්නම් එම දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය සමුද්ධරණය සඳහා

ලිපිනය හිමිකරුට හැකියාව ඇති වූ වේලාවේ දී එය ලබා ගැනීම සිදු වන්නේ ය; හෝ

(ii) දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් ලබා ගැනීමේ කාර්යය සඳහා ලිපිනය හිමිකරු විසින් ඉලෙක්ට්‍රොනික ලිපිනයක් නම් කරනු ලැබ නොමැති හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික ලිපිනයක් දක්වා ඇති අවස්ථාවක දී එම දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය ලිපිනය හිමිකරුට එම ඉලෙක්ට්‍රොනික ලිපිනයේ දී සමුද්ධරණය සඳහා හැකියාව ඇති වූ සහ දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය එම ඉලෙක්ට්‍රොනික ලිපිනය වෙත එවනු ලැබ ඇති බවට ලිපිනය හිමිකරු විසින් දැනගනු ලබන වේලාවේ දී එය ලැබීම සිදු වන්නේ ය.

(ආ) මේ උපවගන්තියේ කාර්යය සඳහා, දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් ලිපිනය හිමිකරුගේ ඉලෙක්ට්‍රොනික ලිපිනය වෙත ළඟා වූ අවස්ථාවේ දී එම දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය එම ලිපිනය හිමිකරුට සමුද්ධරණය සඳහා හැකියාව පැවති බවට පූර්වානුමිතික විය යුතු ය.'';

(3) එහි (5) වන උපවගන්තිය ඉවත්කර පහත දැක්වෙන නව උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

''(5) මේ වගන්තියේ කාර්ය සඳහා -

(අ) මූලාරම්භකයේ හෝ ලිපිනය හිමිකරුගේ ව්‍යාපාර ස්ථානය දක්වා නොමැති නම් හෝ ව්‍යාපාර ස්ථාන එකකට වැඩි ගණනක් ඇත්නම්, ගිවිසුම අවසන් කිරීමට පෙර හෝ එසේ සිදුකරන අවස්ථාවේ දී හෝ ලිපිනය හිමිකරු

විසින් දන්නා පරිදි හෝ ඔහු විසින් අදහස් කර තිබූ පරිදි අදාළ ගිවිසුමට සමීපතම සම්බන්ධතාවයක් පැවති ව්‍යාපාර ස්ථානය, ඔහුගේ ව්‍යාපාර ස්ථානය වන්නේ ය;

(ආ) මූලාරම්භකගේ හෝ ලිපිනය හිමිකරුගේ ව්‍යාපාර ස්ථානයක් නොමැති නම්, ඔහුගේ සාමාන්‍ය පදිංචි ස්ථානය ඔහුගේ ව්‍යාපාර ස්ථානය විය යුතු ය;

(ඇ) (i) යම් නිශ්චිත මූලාරම්භකයකු හෝ ලිපිනය හිමිකරුවකු විසින් ගිවිසුමක් ඇතිකර ගැනීම සම්බන්ධයෙන් භාවිත කරනු ලබන තොරතුරු පද්ධතියක් සඳහා ආධාර කරනු ලැබ ඇති උපකරණ හෝ තාක්ෂණය එම නිශ්චිත ස්ථානයේ පැවතීම;

(ii) එම ස්ථානයේ දී ලිපිනය හිමිකරුට තොරතුරු පද්ධතිය වෙත ප්‍රවේශ විය හැකි වීම,

යන හේතු මත පමණක් යම් ස්ථානයක් ව්‍යාපාර ස්ථානයක් නොවන්නේ ය;

(ඈ) මූලාරම්භක හෝ ලිපිනය හිමිකරු විසින් යම් විශේෂිත රටකට අදාළ වසම් නාමයක් හෝ ඉලෙක්ට්‍රොනික තැපැල් ලිපිනයක් භාවිත කිරීම මගින් එම මූලාරම්භකගේ හෝ එම ලිපිනය හිමිකරුගේ ව්‍යාපාර ස්ථානය එම රටෙහි පිහිටා ඇති බවට පූර්වානුමිතික නොවන්නේ ය;

(ඉ) යම් පාර්ශ්වයක, ව්‍යාපාර ස්ථානය, වෙනත් පාර්ශ්වයක් විසින් එම දක්වන ලද ස්ථානයේ ව්‍යාපාර ස්ථානයක් නොමැති බවට ආදර්ශනය කරන්නේ නම් මිස, යම් පාර්ශ්වයක ව්‍යාපාර ස්ථානය, එම පාර්ශ්වය විසින් දක්වන ලද ස්ථානය බවට පූර්වානුමිතික වන්නේ ය; සහ

(ඊ) සංස්ථාපිත මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට "සාමාන්‍ය පදිංචි ස්ථානය" යන්නෙන්, එය ලියාපදිංචි කර ඇති යම් ස්ථානයක් අදහස් වේ.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන නව වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 14අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 14අ වන නව වගන්තිය ඇතුළත් කිරීම.

"ඉලෙක්ට්‍රොනික සන්නිවේදනවල දෝෂ.

14අ. (1) ස්වභාවික තැනැත්තකු, තවත් පාර්ශ්වයක ස්වයංක්‍රීය පණිවුඩ පද්ධතිය සමග ඉලෙක්ට්‍රොනික ගිවිසුමක් සකස් කිරීම හෝ ක්‍රියාවේ යෙදවීමට අදාළව හුවමාරු කරගන්නා ලද ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයක දී දත්ත ඇතුළත් කිරීමේ දෝෂයක් සිදු කරයි නම් සහ එම දෝෂය නිවැරදි කිරීමේ අවස්ථාවක් ස්වයංක්‍රීය පණිවුඩ පද්ධතිය මගින් එම තැනැත්තා වෙත ලබාදීම සිදු නොකරයි නම්-

(අ) එම තැනැත්තා හෝ එම තැනැත්තා වෙනුවෙන් ක්‍රියා කළ පාර්ශ්වය, වරද පිළිබඳ දැනගත් පසුව නොපමාව, දෝෂය පිළිබඳව අනෙක් පාර්ශ්වයට දැනුම් දෙයි නම් සහ ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයේ දෝෂය ඔහු විසින් සිදු කළ බව දක්වයි නම්; සහ

(ආ) එම පුද්ගලයා හෝ එම පුද්ගලයා වෙනුවෙන් ක්‍රියා කරමින් සිටි පාර්ශ්වය, අනෙක් පාර්ශ්වය වෙතින් ලැබෙන යම් භාණ්ඩ හා සේවා වේ නම්, එම භාණ්ඩ හා සේවා මගින් යම් සැලකිය යුතු ප්‍රතිලාභයක් හෝ අගයක් භාවිතා කිරීම හෝ ලබා ගැනීම සිදු කර නොමැති නම්,

එම තැනැත්තාට, හෝ එම තැනැත්තා වෙනුවෙන් ක්‍රියා කළ පාර්ශ්වයට එම ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයේ දත්ත ඇතුළත් කිරීමේ දෝෂය සිදු කරන ලද කොටස ඉවත් කර ගැනීමට අයිතිය පවතී.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට හැර අන්‍යාකාරයකින් යම් දෝෂයක ප්‍රතිඵල තීරණය කළ හැකි යම් නෛතික රීතියක අදාළත්වය සම්බන්ධයෙන් මේ වගන්තියේ සඳහන් කිසිවකින් බලපෑමක් නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (2) වන උපවගන්තිය "මේ පනතේ මේ කොටසේ" සහ "ප්‍රතීත සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්" යන වචන වෙනුවට, "මේ පනතේ" සහ "බලපත්‍රලත් හෝ බලයලත් සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්" යන වචන පිළිවෙළින් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ නව වගන්තිය ඇතුළත් කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන නව වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 18අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"කාර්ය සාධක බලකායන් පත් කිරීමට අමාත්‍යවරයා සතු බලතල.

18අ. නිසි පරිපාලනයක් සිදුවීම සහතිකවීමේ අරමුණ ඇතිව සහ සුදුසුකම් සහ පළපුරුද්ද එමෙන් ම අදාළ අවදානම දරන්නන් නියෝජනය වීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින්, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත, සහතික කිරීමේ බලාධිකාරිය කළමනාකරණය සහ පරිපාලනය සඳහා, කාර්ය සාධක බලකායක් හෝ පුද්ගල මණ්ඩලයක් පත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (අ) ඡේදයේ, "ප්‍රතීතනය කිරීම" යන වචන වෙනුවට, "වෙත බලපත්‍ර ලබාදීම හෝ බලය දීම" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (ආ) සහ (ඇ) ඡේද, ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නව ඡේද ආදේශ කිරීමෙන්:—

"(ආ) අභියාචනා විභාග කිරීම සහ මේ පනතේ කාර්ය සඳහා බලපත්‍රයක් හෝ බලය දීමක් ප්‍රදානය කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නිශ්චිතව සඳහන් කිරීම;

(ඇ) අවස්ථාවෝචිත පරිදි, 20 වන වගන්තිය යටතේ බලපත්‍රයක් හෝ බලය දීමක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලැබූ අවස්ථාවක දී අභියාචනා විභාග කිරීමේ කාර්ය පටිපාටිය නිශ්චිතව සඳහන් කිරීම;"; සහ

(3) එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන නව ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇඅ) සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්ට, සත්‍යාපනය කිරීමේ කාර්ය සඳහා ජීවමිතික දත්ත සහ වෙනත් වලංගු කිරීමේ තාක්ෂණයන් භාවිතා කිරීම සඳහා වූ ක්‍රියාකාරී රාමුව සහ ආරක්ෂක කාර්ය පටිපාටිය ඇතුළුව, නියම කරනු ලැබිය හැකි එවැනි උපමානයන්ට සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව විවිධ වර්ගයේ ඉලෙක්ට්‍රොනික අත්සන් නිකුත් කිරීමට බලය දීම;".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නව උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) කලින් කලට නියම කරන ලද උපමානයන්ට අනුකූලව සහතික කිරීමේ බලාධිකාරය විසින් සහතික කිරීමේ සේවා සැපයුම්කරුවකුට බලපත්‍රයක් ලබා දීම හෝ බලය දීම සිදු කරනු ලැබිය හැකි ය.";

(2) එහි (2) වන උපවගන්තියේ, "ප්‍රතීතනය කරනු ලැබීමකින් තොරව," යන වචන වෙනුවට, "බලපත්‍රයක් ලැබීම හෝ බලය ලැබීමකින් තොරව," යන වචන ආදේශ කිරීමෙන් :—

(3) එහි (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්; සහ

(4) එහි පැති සටහන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

"සහතික කිරීමේ සේවා සපයන්නන්ට බලපත්‍ර දීම හෝ බලය දීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන නව ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඇඇ) පහත දැක්වෙන ස්වභාවයෙන් යුතු වන ඕනෑම මූල්‍යමය කාරණයක්:—

(i) නියාමනය කරන ලද විනිමයක් සම්බන්ධ ගනුදෙනු;

(ii) විදේශ විනිමය ගනුදෙනු;

(iii) අන්තර්-බැංකු ගෙවීම් පද්ධති, අන්තර්-බැංකු ගෙවීම් එකඟතාවයන් හෝ සුරැකුම්පත් හෝ වෙනත් මූල්‍ය වත්කම් හෝ නීතිමය ලියවිලිවලට අදාළ නිශ්කාශනය කිරීමේ සහ පියවීමේ පද්ධති; සහ

(iv) විකිණීමක, ණය මුදලක හෝ අතරමැදියකු විසින් දරන ලද සුරැකුම්පත් හෝ වෙනත් මූල්‍ය වත්කම් හෝ නීතිමය ලියවිලි දැරීමක දී හෝ ඒවා නැවත මිලදී ගැනීම සඳහා වූ ගිවිසුමක සුරක්ෂිත අයිතිවාසිකම් පැවරීම;";

(2) එහි (ඉ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඉ) අනුමිත, ව්‍යංජිත හෝ ප්‍රතිඵලීය භාරයක් හැර, (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ භාරයක් කෙරෙහි;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන උපවගන්තියේ "2 වන වගන්තියේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2 වන වගන්තියේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නව ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) 18අ වන වගන්තියට අනුව, සහතික කිරීමේ අධිකාරිය කළමනාකරණය සහ පරිපාලනය කිරීම සඳහා පත්කරනු ලබන කාර්ය සාධක බලකායේ හෝ පුද්ගල මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සහ ඔවුන්ට අදාළ වන වෙනත් නියමයන් සහ කොන්දේසි;";

(3) එහි (2) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ "20 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන් ප්‍රතීතනය සඳහා උපමාන" යන වචන වෙනුවට "20 වන වගන්තිය යටතේ සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීම හෝ බලය දීම සඳහා උපමාන" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එහි (2) වන උපවගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන නව ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඈඅ) සත්‍යාපනය කිරීමේ කාර්ය සඳහා ජීවමිතික දත්ත සහ වෙනත් වලංගු කිරීමේ තාක්ෂණයන් භාවිතය සඳහා වූ ක්‍රියාකාරී රාමුව සහ ආරක්ෂණ කාර්ය පටිපාටීන් ඇතුළුව, විවිධ වර්ගයේ ඉලෙක්ට්‍රොනික අත්සන් නිකුත් කිරීම පිණිස සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන් සඳහා උපමානයන් සහ මාර්ගෝපදේශයන් නියම කිරීමට;"; සහ

(5) එහි (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ "ප්‍රතීතන සහතිකයක්" යන වචන වෙනුවට "බලපත්‍රයක් හෝ බලය දීමක්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "ලිපිනය හිමිකරු" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන නව අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:—

"ස්වයංක්‍රීය පණිවුඩ පද්ධතිය" යන්නෙන්, පද්ධතිය මගින් ක්‍රියාවක් ආරම්භ කරන හෝ ප්‍රතිචාරයක් ජනනය කරන සෑම අවස්ථාවක දී ම ස්වාභාවික තැනැත්තකුගේ මැදිහත්වීමකින් තොරව සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් යම් ක්‍රියාවක් ආරම්භ කිරීම සඳහා හෝ දත්ත

පණිවුඩයකට ප්‍රතිචාර දැක්වීම සඳහා හෝ ක්‍රියාවේ යෙදවීම සඳහා භාවිත කරන ලද පරිගණක වැඩසටහනක් හෝ ඉලෙක්ට්‍රොනික හෝ වෙනත් ස්වයංක්‍රීය ක්‍රමවේදයක් අදහස් වේ;";

(2) "පරිගණකය" යන පදයේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන නව අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:—

"සම්මුතිය" යන්නෙන්, තහවුරු කරන ලද අවස්ථාවේ දී කරන ලද ප්‍රකාශයට යටත්ව, 2015 ජූලි මස 7 වන දින ශ්‍රී ලංකාව විසින් තහවුරු කරන ලද අන්තර්ජාතික ගිවිසුම්වල දී ඉලෙක්ට්‍රොනික සන්නිවේදන භාවිතය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය අදහස් වේ;";

(3) "ඉලෙක්ට්‍රොනික" යන පදයේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන නව අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:—

"ඉලෙක්ට්‍රොනික ලිපිනය" යන්නෙන්, යම් තැනැත්තකු විසින් දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් ලබාගැනීම සඳහා භාවිත කරනු ලබන සන්නිවේදන ජාලයක්, ඉලෙක්ට්‍රොනික තැපැල් පෙට්ටියක්, ටෙලිකොපි උපකරණයක් හෝ තොරතුරු පද්ධතියක් තුළ පිහිටි නිශ්චිත කොටසක් හෝ ස්ථානයක් අදහස් වේ;

"ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය" යන්නෙන්, දත්ත පණිවුඩයක් මගින් සකස් කරන ලද ඕනෑම සන්නිවේදනයක් අදහස් වේ;";

(4) "ඉලෙක්ට්‍රොනික අත්සන" යන පදයේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:—

"ඉලෙක්ට්‍රොනික අත්සන" යන්නෙන්, දත්ත පණිවුඩයක, ඉලෙක්ට්‍රොනික ලේඛනයක, ඉලෙක්ට්‍රොනික වාර්තාවක හෝ වෙනත් සන්නිවේදනයක

අත්සන්කරු හඳුනාගැනීමට සහ එහි අන්තර්ගත තොරතුරු සම්බන්ධයෙන් අත්සන්කරුගේ චේතනාව දැක්වීමට භාවිත කළ හැකි දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් හා තාර්කිකව සම්බන්ධ වී තබන ලද ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් වන දත්ත අදහස් වේ;";

(5) "අතරමැදියා" යන පදයේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන නව අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"අමාත්‍යවරයා" යන්නෙන්" 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;";

(6) "මූලාරම්භක" යන පදයේ අර්ථ නිරූපණය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන නව අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයක "මූලාරම්භක" යන්නෙන්, ගබඩාගතවීමට පෙර ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය යවනු ලැබ ඇති හෝ ආරම්භ කර ඇති නම් එසේ කරන ලද තැනැත්තා හෝ එසේ කරන ලද්දේ කා වෙනුවෙන් ද එම තැනැත්තා අදහස් වේ; නමුත් එම ඉලෙක්ට්‍රොනික ගනුදෙනුවට අදාළව අතරමැදියෙකු වශයෙන් ක්‍රියාකරන පුද්ගලයකු එයට ඇතුළත් නොවේ;

"නියම කිරීම" යන්නෙන්, මෙම පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කිරීමක් අදහස් වේ;"; සහ

(7) "ආරක්ෂක කාර්ය පටිපාටිය" යන පදයේ අර්ථ නිරූපණයේ "නිකුත් කළ සහතිකයක්" යන වචන වෙනුවට "නිකුත් කළ බලපත්‍රයක් හෝ බලය දීමක්" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**18.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.